# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2025 අංක 14 දරන
# ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2025 අගෝස්තු මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2025 අගෝස්තු මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 100.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2025 අංක 14 දරන**
**ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2025 අගෝස්තු මස 18 වන දින]

එල්.ඩී.-ඕ 17/2025

**2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1**. මේ පනත 2025 අංක 14 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2**. (මෙහි මින්මතු ‘‘ප්‍රධාන ප්‍රඥප්තිය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) 2024 අංක 36 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ දීර්ඝ නාමය, ‘‘ජාතික විදුලිබල උපදේශක සභාව පිහිටුවීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද;’’, යන වචන වෙනුවට, ‘‘බලශක්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කිරීමට විධිවිධාන සැලැස්වීම සඳහා ද;’’ යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. 2024 අංක 36 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම

**3**. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ - ප්‍රධාන ප්‍රඥප්තියට කෙරෙන පොදු සංශෝධන

(අ) 2 වන වගන්තියේ (ඇ) ඡේදයේ, 29 වන වගන්තියේ (4) වන උපවගන්තියේ සහ 30 වන වගන්තියේ (1) වන, (2) වන සහ (4) වන උපවගන්තිවල හැර ‘‘තොග විදුලිබල වෙළෙඳපොළ’’ යන යෙදුම යෙදෙන කවර හෝ අවස්ථාවක දී ඒ යෙදුම වෙනුවට, ‘‘ජාතික විදුලිබල වෙළෙඳපොළ’’ යන යෙදුම; සහ

(ආ) 3 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන ජාතික විදුලිබල උපදේශක සභාවට අදාළව, ‘‘සභාව’’ යන වචනය යෙදෙන කවර හෝ අවස්ථාවක දී ඒ වචනය වෙනුවට, ‘‘අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කමිටුව’’ යන යෙදුම,

ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන ප්‍රකාරව නිකුත් කරන ලද යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක -

(අ) “තොග විදුලිබල වෙළෙඳපොළ” සම්බන්ධයෙන් ඇති සෑම සඳහනක් ම “ජාතික විදුලිබල වෙළෙඳපොළ” සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය; සහ

(ආ) ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය යටතේ පිහිටුවනු ලබන ජාතික විදුලිබල උපදේශක සභාවට අදාළව, “සභාව” සම්බන්ධයෙන් ඇති සෑම සඳහනක් ම “අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කමිටුව” සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තිය සංශෝධනය කිරීම

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ “4 වන වගන්තියේ, 9 වන වගන්තියේ,” යන වචන සහ ඉලක්කම් යෙදෙන කවර හෝ අවස්ථාවක දී ඒ වචන සහ ඉලක්කම් වෙනුවට, “4 වන වගන්තියේ, 5 වන වගන්තියේ, 9 වන වගන්තියේ,” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ පළමුවන අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන්:-

“එසේ වුව ද, එවැනි නියමයක් සිදු කිරීමට පෙර -

(අ) ක්ෂේත්‍රබල ප්‍රතිසංස්කරණ ලේකම් කාර්යාලය විසින් මූලික පැවරීමේ සැලැස්ම සකස් කර ඇති බවට;

(ආ) බලශක්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ජාතික අයක්‍රම ප්‍රතිපත්තිය ඇතුළත් ජාතික විදුලිබල ප්‍රතිපත්තිය අමාත්‍යවරයා විසින් සකස් කර, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇති බවට; සහ

(ඇ) ජාතික පද්ධති ක්‍රියාකරු විසින් සකස් කරනු ලබන දීර්ඝකාලීන විදුලිබල පද්ධති සංවර්ධන සැලැස්ම බලාත්මක වනතෙක් අදාළ විය යුතු වාර්ෂික විදුලිබල ප්‍රසම්පාදන සැලැස්ම සහ දීර්ඝකාලීන උත්පාදන පුළුල් කිරීමේ සැලැස්ම සහ දීර්ඝකාලීන සම්ප්‍රේෂණ සංවර්ධන සැලැස්ම ලංකා විදුලිබල මණ්ඩලය විසින් සකස් කර ඇති බවට,

අමාත්‍යවරයා සෑහීමට පත් විය යුතු ය.'';

(ආ) ඒ උපවගන්තියේ දෙවන අතුරු විධානය ඉවත් කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

''(ආ) 30 වන වගන්තියේ (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති එක් එක් විදුලිබල වෙළෙඳපොළ, 30 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ක්‍රියාත්මකභාවයට එළඹෙනු ලබන්නේ කවර දිනවල සිට ද, එකී දින.'';

(4) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ ''පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය:'' යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු ම වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:-

''පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.'';

සහ

(5) ඒ වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(6) (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, අමාත්‍යවරයා විසින් ඒ උපවගන්තියේ අතුරු විධානයේ අවශ්‍යතා සපුරා ඇති බවට සෑහීමට පත් වුව ද, ඒ උපවගන්තිය මගින් නියම කර ඇති ආකාරයට නියමිත දිනයක් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ නොමැති නම් මේ වගන්තියේ, 2 වන වගන්තියේ, 3 වන වගන්තියේ, 4 වන වගන්තියේ, 5 වන වගන්තියේ, 9 වන වගන්තියේ, 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ, 10 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ, 10 වන වගන්තියේ (3) වන උපවගන්තියේ, 10 වන වගන්තියේ (5) වන උපවගන්තියේ, 14 වන වගන්තියේ, 15 වන වගන්තියේ, 17 වන වගන්තියේ, 18 වන වගන්තියේ, 38 වන වගන්තියේ, 39 වන වගන්තියේ සහ මේ වගන්තියේ (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති වගන්තිවල විධිවිධාන හැර, මේ පනතේ විධිවිධාන මේ උපවගන්තිය ක්‍රියාත්මක වන දිනයේ සිට මාස හතරක් ඉකුත් වූ වහාම ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**5**. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ "කාර්යක්ෂම සහ පිරිමැසුම්දායක විදුලිබල සැපයුම්" යන වචන වෙනුවට, "කාර්යක්ෂම, පිරිමැසුම්දායක, අඛණ්ඩ සහ විශ්වසනීය විදුලිබල සැපයුම්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "තොග විදුලිබල වෙළෙඳපොළ" යන වචන වෙනුවට, " විවිධාංග කරන ලද විදුලිබල අංශය සහ ජාතික විදුලිබල වෙළෙඳපොළ" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (උ) ඡේදයේ ‘‘වැඩිදියුණු කරන ලද ප්‍රමිතීන්,’’ සහ ‘‘තුළින් උද්ගත වන අන්තරායයන්ගෙන්’’ යන වචන වෙනුවට, පිළිවෙළින් ‘‘වැඩිදියුණු කරන ලද ආරක්ෂක ප්‍රමිතීන්,’’ සහ ‘‘හා සම්බන්ධ අවදානම්වලින්’’ යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ වගන්තියේ (එ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

‘‘(එ) ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව, කාබන්හරණය සඳහා වන රජයේ අන්තර්ජාතික බැඳීම් ඉටු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ විදුලිබල කර්මාන්තය මගින් හරිතාගාර වායූන් මුදා හරිනු ලබන ප්‍රමාණය අවම කිරීම, පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම සහ දේශීය බලශක්ති විභව ඒකාබද්ධ කිරීම ප්‍රශස්ත කිරීම.’’.

ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසේ ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසේ ශීර්ෂය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ:-

**‘‘ බලශක්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරීම’’.**

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ඉවත් කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මගින් පිහිටුවන ලද ජාතික විදුලිබල උපදේශක සභාව විසින් මේ වගන්තිය ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව, ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව යථා පරිදි කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**8**. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "රජයේ ප්‍රතිපත්තිය" යන වචන වෙනුවට, "ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(2) මේ වගන්තිය ක්‍රියාත්මක වීමෙන් පසුව, අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව, අනාගත ඉහළ යන විදුලිබල ඉල්ලුම සපුරාලීමට ශ්‍රී ලංකාවට හැකියාව ලබා දීමේ අදහස ඇතිව, නියාමක, ජාතික පද්ධති ක්‍රියාකරු, බලපත්‍රලාභීන්, පාරිභෝගික සංවිධාන සහ අදාළ වෙනත් පරදු දරන්නන් විමසීමෙන් පසුව සහ අදාළ සියලු ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රතිපත්ති මාර්ගෝපදේශවලට අනුකූලව, බලශක්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ජාතික විදුලිබල ප්‍රතිපත්ති කෙටුම්පත සකස් කිරීම සඳහා පහත දැක්වෙන ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක අවම වශයෙන් වසර පහළොවක විශේෂඥතාවක් ඇති තැනැත්තන් අට දෙනෙකුට නොවැඩි ගණනකින් සමන්විත (මෙහි මින්මතු "අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කමිටුවක් පත් කරනු ලැබිය යුතු ය:-

(අ) බලශක්තිය පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීම;

(ආ) ආර්ථික විද්‍යාව;

(ඇ) මූල්‍ය;

(ඈ) බලශක්ති පද්ධති සැලසුම් කිරීම; සහ

(ඉ) පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්ති සංක්‍රාන්තිය.

(2අ) යම් තැනැත්තකු -

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකුව සිටීම නතර වේ නම්;

(ii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ පත් කරනු ලැබීමට පෙරාතුව වූ අවුරුදු තුනක් ඇතුළත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුව, පළාත් සභා මන්ත්‍රීවරයකුව හෝ පළාත් පාලන ආයතනයක සභිකයකුව සිට ඇත්තේ නම්;

(iii) විදුලිබල කර්මාන්තයේ යම් අස්තිත්වයක හෝ ඒ තැනැත්තා විසින් ඉටු කරනු ලබන වෙනත් යම් කාරණයක දී ඍජුව හෝ වක්‍රව බැඳීම් අතර ඝට්ටනයකට තුඩු දෙන මූල්‍යමය හෝ වෙනත් යම් සම්බන්ධතාවක් සහිත සම්බන්ධිත තැනැත්තකු වේ නම්;

(iv) ශ්‍රී ලංකාවේ බලපවත්නා යම් ලිඛිත නීතියක් යටතේ සිහිවිකල තැනැත්තකු බවට හඳුනාගනු ලබන්නේ නම් හෝ ප්‍රකාශ කරනු ලබන්නේ නම්;

(v) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් ලිඛිත නීතියක් යටතේ වස්තු භංගත්වයට හෝ බුන්වත්භාවයට පත්ව ඇති බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ නම් හෝ වස්තු භංගත්වයට හෝ බුන්වත්භාවයට පත්ව නිදහස් කරනු ලැබ නොමැත්තේ නම්;

(vi) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් යම් අපරාධමය වරදකට වරදකරු කරනු ලැබ ඇත්තේ නම්; හෝ

(vii) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කමිටුවේ සාමාජිකයකු වශයෙන් එකී තැනැත්තා වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමෙන් එකී තැනැත්තාව වළක්වන යම් මානසික හෝ ශාරීරික දුබලතාවකින් පෙළෙන්නේ නම්,

ඒ තැනැත්තා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කමිටුවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස දිගටම කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

(2ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කමිටුවේ යම් සාමාජිකයකු (2අ) උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් නුසුදුසුකමකට යටත් වන්නේ නම්, අමාත්‍යවරයා විසින් ඒ සඳහා හේතු ලිඛිතව අමාත්‍ය මණ්ඩලය වෙත දැනුම් දීමෙන් පසු ඒ සාමාජිකයාව ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(2ඇ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කමිටුවේ සාමාජිකයන්, අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස, අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

(2ඈ) අමාත්‍යවරයා විසින් යම් සාමාජිකයකු තවත් අවුරුදු තුනක ධුර කාලයක් සඳහා නැවත පත් කරනු ලැබිය හැකි ය.

(2ඉ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන කමිටුව, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.”.

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ “(2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාගේ විධානයට අනුකූලව පහත දැක්වෙන කරුණු” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “පහත දැක්වෙන කරුණු” යන වචන ආදේශ කිරීමෙන්;

(4) ඒ වගන්තියේ (9) වන උපවගන්තියේ “(1) සිට (7) දක්වා වූ උපවගන්තිවල” යන වචන සහ ඉලක්කම් වෙනුවට, “(4) සිට (7) දක්වා වූ උපවගන්තිවල” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(5) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

“බලශක්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ජාතික විදුලිබල ප්‍රතිපත්තිය සකස් කිරීම”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**9**. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඕ) ඡේදයේ “ආර්ථිකමය වශයෙන් අඩුම පිරිවැයකට ප්‍රේෂණය කිරීම” යන වචන වෙනුවට, “ආර්ථිකමය වශයෙන් ආරක්ෂාකාරීව මෙහෙයවීමේ සීමාවන්ට යටත්ව ප්‍රේෂණය කිරීම” යන වචන ආදේශ කිරීමෙන් ඒ ඡේදය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

**10**. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ -

(අ) ඒ වගන්තියේ (ආ) ඡේදයේ “තැනැත්තන්ගෙන් සමන්විත වන” යන වචනවල සිට ඒ ඡේදයේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:-

“සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත වන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන

අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත සතු කරනු ලැබිය යුතු අතර, ඔවුන්ගෙන් එක් අයකු අමාත්‍යවරයා විසින් සභාපති වශයෙන් පත් කරනු ලැබිය යුතු ය:-

(i) අතිරේක ලේකම්වරයකුගේ තනතුරට වඩා අඩු නොවන තනතුරක් හෝ ඒ හා සමාන තත්ත්වයක් දරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් නියෝජිතයකු;

(ii) භාණ්ඩාගාරයේ යම් නියෝජ්‍ය ලේකම්වරයකු;

(iii) බලශක්ති පද්ධති මෙහෙයවීම සහ සැලසුම් කිරීම පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු;

(iv) ප්‍රසම්පාදනය පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු; සහ

(v) පහත දැක්වෙන ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු:-

අ. මූල්‍ය;

ආ. ආර්ථික විද්‍යාව;

ඇ. ගිණුම්කරණය; හෝ

ඈ. වාණිජ නීතිය.”;

(ආ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන්:-

"(ඊ) අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුරය දරනු ලැබිය යුතු ය.

(උ) අමාත්‍යවරයා විසින් යම් සාමාජිකයකු තවත් අවුරුදු තුනක ධුර කාලයක් සඳහා නැවත පත් කරනු ලැබිය හැකි ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ "ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතියේ" යන වචන වෙනුවට, "අඛන්ඩ සහ විශ්වාසදායක විදුලිබල සැපයුමක් සහතික කරමින් ශ්‍රී ලංකාවේ විදුලිබල පද්ධතියේ" යන වචනය ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "සෑම වසර දෙකකට වතාවක්" යන වචන වෙනුවට, "නියමිත දින සිට අවුරුදු එකක් ඇතුළත සහ ඉන්පසුව සෑම අවුරුදු දෙකකට වරක්";

(4) ඒ වගන්තියේ (12) වන උපවගන්තියේ "තැනැත්තන් සමඟ" යන වචන වෙනුවට, "සමාගම් සමඟ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(5) ඒ වගන්තියේ (14) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(15) ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, 15 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ඌ) ඡේදයේ විධිවිධානවලට අනුව ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සම්බන්ධයෙන් වන ජාලක කේත සංග්‍රහය සහ අනෙකුත් තාක්ෂණික සහ මෙහෙයුම් කේත සංග්‍රහ සහ ප්‍රමිතීන් කෙටුම්පත් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම සිදු කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම

**11**. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ -

(අ) "(3) වන උපවගන්තියේ දක්වා ඇති" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "(3) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයක් මගින් නිශ්චිතව දක්වා ඇති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ "(3) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "(3) වන උපවගන්තිය යටතේ සාදන ලද නියමයක් මගින් නිශ්චිතව දක්වා ඇති" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ ඡේදයේ "තරඟකාරී සහ විනිවිදභාවයකින් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියකට අනුව තෝරා ගනු ලැබිය යුතු ය:" යන වචනවල සිට ඒ ඡේදයේ අවසානය දක්වා ඇති සියලුම වචන ඉවත් කර ඒ වෙනුවට, "තරඟකාරී සහ විනිවිදභාවයකින් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියකට අනුව තෝරා ගනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "හැකි ඉක්මනින්" යන වචන වෙනුවට, "එම නිර්දේශය ලැබුණු දින සිට වැඩකරන දින තිහක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "අමාත්‍යවරයා විසින්," යන වචනවල සිට "උපරිම ධාරිතාවය නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය:" දක්වා වූ සියලු වචන වෙනුවට, "අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, 30 වන වගන්තියේ (4) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව, ජාතික පද්ධති ක්‍රියාකරු හා බෙදාහැරීමේ බලපත්‍රලාභීන් සමඟ ප්‍රමාණීකෘත

විදුලිබලය මිල දී ගැනීමේ ගිවිසුම්වලට එළඹීමට අවසර දිය හැකි, පුනර්ජනනීය බලශක්ති තාක්ෂණය මත පදනම් වූ එක් එක් විදුලි පිරියතයකම එවැනි විදුලි පිරියතයක් සමඟ ඍජුව සම්බන්ධ වූ ගබඩා කිරීම් සහ ආනුෂංගික සේවා ඇතුළුව එහි උපරිම ධාරිතාවය, නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ය:" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

"(4) ජාතික පද්ධති ක්‍රියාකරු විසින්, අඩුම පිරිවැයකට යම් තැනැත්තකු විසින් සපයනු ලැබීමට අවශ්‍ය වන හදිසි ධාරිතාව සැපයීම පිළිබඳ විභවීය ප්‍රතිලාභය, දීර්ඝ ටෙන්ඩර් කැඳවීමේ ක්‍රියාවලියට වඩා වැදගත්කමකින් යුතු වන්නාවූ අවස්ථාවක දී, අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පරිදි ජාතික ව්‍යසනයක් හෝ ප්‍රධාන උත්පාදන පිරියතයක අනපේක්ෂිත දීර්ඝකාලීන විදුලිය ක්‍රියා විරහිත කිරීමක් අතරතුර දී, යම් හදිසි අවස්ථාවකට මුහුණ දීම සඳහා යම් අලුත් උත්පාදන පිරියතයක් සැපයීම හෝ යම් පවත්නා උත්පාදන පිරියතයක් පුළුල් කිරීම සම්බන්ධයෙන් ටෙන්ඩරයක් භාර දීමේ අවශ්‍යතාවය නොසලකා ක්‍රියා කරනු ලැබිය හැකි ය.

(5) හදිසි අවස්ථාව එක් වසරකට වඩා පැවතීමත් සමඟ අවශ්‍ය පරිදි අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමතය ලබාගෙන ඇත්නම් මිස ටෙන්ඩරයක් ඉදිරිපත් කිරීමකින් තොරව උත්පාදන පිරියතවලින් විදුලිබලය හදිසි මිල දී ගැනීමේ එකී කාලසීමාව අමාත්‍ය මණ්ඩලයේ ඊට අදාළ තීරණයෙන් එක් අවුරුද්දකට වඩා දීර්ඝ කරනු නොලැබිය යුතු ය.

(6) 30 වන වගන්තිය යටතේ සාදන ලද නියමයක් මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි තරඟකාරී ආනුෂංගික සේවා වෙළඳපොළ ක්‍රියාත්මක වීම ආරම්භ කළ දිනයේ සිට සහ ඉන්පසුව (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධාන ක්‍රියාත්මක වීම නතර විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම

**12**. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ ''සියයට පනහකට වැඩි ප්‍රමාණයක්'' යන වචන වෙනුවට, ''සියයට සියයක ප්‍රමාණයක්'' යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ ''යම් තැනැත්තකු'' යන වචන වෙනුවට, ''2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව සංස්ථාගත කර ඇති යම් සමාගමක්'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ ''තැනැත්තකු සඳහා'' යන වචන වෙනුවට, ''සමාගමක් සඳහා'' යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම

**13**. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (අ)ඡේදයේ, ''පැවරුම් සැලැස්මේ'' සහ ''සංස්ථාගත කරන ලද සීමාසහිත සමාගම්'' යන වචන වෙනුවට, පිළිවෙළින් ''මූලික පැවරීමේ සැලැස්මේ'' සහ ''සංස්ථාගත කරන ලද I වන උපලේඛනයේ (අ), (ඉ), (ඊ), (උ), (ඌ)(i) සහ (ඌ)(ii) අයිතමවල දක්වා ඇති සීමාසහිත සමාගම්'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

''(අඅ) 18 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයේ සිට අවුරුදු එකක කාලසීමාවක්

ඇතුළත, 1 වන උපලේඛනයේ (අ) සහ (උ) අයිතමවල දක්වා ඇති සමාගම්වල කටයුතු සහ සියලු වත්කම් සහ බැරකම්, එම සමාගම්වල අදාළ කාර්ය සහ කර්තව්‍ය සමඟ අවසාන පැවරීමේ සැලැස්මේ සැලසුම් කර ඇති පරිදි තවදුරටත් විවිධාංග කළ යුතු අතර (1) වන උපවගන්තිය ප්‍රකාරව සංස්ථාගත කරන ලද I වන උපලේඛනයේ (එ)(i) සහ (එ)(ii) අයිතමවල දක්වා ඇති සීමාසහිත සමාගම් වෙත සතු කරනු ලැබිය යුතු ය.";

(ඇ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) I වන උපලේඛනයේ (අ), (ඉ), (ඊ), (උ) සහ (ඌ)(ii) අයිතමවල දක්වා ඇති සමාගම් සහ I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති ජල විදුලිබල උත්පාදනයට අදාළ සමාගම හැර, මේ වගන්තිය යටතේ සංස්ථාගත කරන ලද අනුප්‍රාප්තික සමාගම්වල කොටස්වලින් සියයට සියයක් ආරම්භයේ දී භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත පවරනු ලැබිය යුතු අතර, I වන උපලේඛනයේ (අ), (ඉ), (ඊ), (උ) සහ (ඌ)(ii) අයිතමවල දක්වා ඇති සමාගම් සහ I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති ජල විදුලිබල උත්පාදනයට

අදාළ සමාගම සම්බන්ධයෙන් වන විට කොටස්වලින් සියයට සියයක් භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත ස්ථිරව ම පවරනු ලැබිය යුතුය.”; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

“(4) I වන උපලේඛනයේ (අ) අයිතමයේ දක්වා ඇති සමාගමේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය, පහත දැක්වෙන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත සතු කරනු ලැබිය යුතු අතර ඔවුන්ගෙන් එක් අයකු අමාත්‍යවරයා විසින් සභාපති ලෙස පත් කරනු ලැබිය යුතු ය:-

(අ) අතිරේක ලේකම්වරයකුගේ තනතුරට වඩා අඩු නොවන තනතුරක් හෝ ඒ හා සමාන තත්ත්වයක් දරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් නියෝජිතයකු;

(ආ) භාණ්ඩාගාරයේ යම් නියෝජ්‍ය ලේකම්වරයකු;

(ඇ) විදුලිබල උත්පාදන පද්ධති කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු;

(ඈ) ප්‍රසම්පාදනය පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු;

(ඉ) පහත දැක්වෙන ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු:-

(i) මූල්‍ය කළමනාකරණය;

(ii) ආර්ථික විද්‍යාව;

(iii) ගිණුම්කරණය; හෝ

(iv) වාණිජ නීතිය.

(5) I වන උපලේඛනයේ (ඉ) අයිතමයේ දක්වා ඇති සමාගමේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය, පහත දැක්වෙන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත සතු කරනු ලැබිය යුතු අතර ඔවුන්ගෙන් එක් අයකු අමාත්‍යවරයා විසින් සභාපති ලෙස පත් කරනු ලැබිය යුතු ය:-

(අ) අතිරේක ලේකම්වරයකුගේ තනතුරට වඩා අඩු නොවන තනතුරක් හෝ ඒ හා සමාන තත්ත්වයක් දරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් නියෝජිතයකු;

(ආ) භාණ්ඩාගාරයේ යම් නියෝජ්‍ය ලේකම්වරයකු;

(ඇ) විදුලිබල සම්ප්‍රේෂණ පද්ධති කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු;

(ඈ) ප්‍රසම්පාදනය පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු;

(ඉ) පහත දැක්වෙන ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු:-

(i) මූල්‍ය කළමනාකරණය;

(ii) ආර්ථික විද්‍යාව;

(iii) ගිණුම්කරණය; හෝ

(iv) වාණිජ නීතිය.

(6) I වන උපලේඛනයේ (උ) අයිතමයේ දක්වා ඇති සමාගමේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය, පහත දැක්වෙන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත සතු කරනු ලැබිය යුතු අතර ඔවුන්ගෙන් එක් අයකු අමාත්‍යවරයා විසින් සභාපති ලෙස පත් කරනු ලැබිය යුතු ය:-

(අ) අතිරේක ලේකම්වරයකුගේ තනතුරට වඩා අඩු නොවන තනතුරක් හෝ ඒ හා සමාන තත්ත්වයක් දරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් නියෝජිතයකු;

(ආ) භාණ්ඩාගාරයේ යම් නියෝජ්‍ය ලේකම්වරයකු;

(ඇ) විදුලිබල බෙදා හැරීමේ පද්ධති කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු;

(ඈ) ප්‍රසම්පාදනය පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු;

(ඉ) පහත දැක්වෙන ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු:-

(i) මූල්‍ය කළමනාකරණය;

(ii) ආර්ථික විද්‍යාව;

(iii) ගිණුම්කරණය; හෝ

(iv) වාණිජ නීතිය.

(7) I වන උපලේඛනයේ (ඌ)(i) අයිතමයේ දක්වා ඇති සමාගමේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය, පහත දැක්වෙන සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත සතු කරනු ලැබිය යුතු අතර ඔවුන්ගෙන් එක් අයකු අමාත්‍යවරයා විසින් සභාපති ලෙස පත් කරනු ලැබිය යුතු ය:-

(අ) අතිරේක ලේකම්වරයකුගේ තනතුරට වඩා අඩු නොවන තනතුරක් හෝ ඒ හා සමාන තත්ත්වයක් දරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් නියෝජිතයකු;

(ආ) භාණ්ඩාගාරයේ යම් නියෝජ්‍ය ලේකම්වරයකු;

(ඇ) විදුලිබල ක්ෂේත්‍රයේ ආයතනික කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුද්දක් ඇති එක් තැනැත්තකු;

(ඈ) ප්‍රසම්පාදන පිළිබඳ අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු;

(ඉ) පහත දැක්වෙන ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති එක් තැනැත්තකු:-

(i) මූල්‍ය කළමනාකරණය;

(ii) ආර්ථික විද්‍යාව;

(iii) ගිණුම්කරණය; හෝ

(iv) වාණිජ නීතිය.

(8) I වන උපලේඛනයේ (ඍ)(ii) අයිතමයේ දක්වා ඇති සමාගමේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය, පහත දැක්වෙන සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත වන අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත සතු කරනු ලැබිය යුතු අතර ඔවුන්ගෙන් එක් අයකු අමාත්‍යවරයා විසින් සභාපති ලෙස පත් කරනු ලැබිය යුතු ය:-

(අ) අතිරේක ලේකම්වරයකුගේ තනතුරට වඩා අඩු නොවන තනතුරක් හෝ ඒ හා සමාන තත්ත්වයක් දරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ යම් නියෝජිතයකු;

(ආ) භාණ්ඩාගාරයේ යම් නියෝජ්‍ය ලේකම්වරයකු;

(ඇ) පහත දැක්වෙන ක්ෂේත්‍ර එකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක අවම වශයෙන් වසර පහළොවක පළපුරුද්දක් ඇති තැනැත්තන් තිදෙනෙකු:-

(i) මූල්‍ය කළමනාකරණය;

(ii) ආර්ථික විද්‍යාව;

(iii) ගිණුම්කරණය; හෝ

(iv) වාණිජ නීතිය;

(ඇ) නියමිත දිනට පෙරාතුව ම වූ දිනයේ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කරමින් සිටින සේවානියුක්තයන් සහ ලංකා විදුලිබල මණ්ඩලයේ පෙර සේවානියුක්තයන් අතරින් තැනැත්තන් හතර දෙනෙකු.

(9) (අ) සභාපති ද ඇතුළුව (4) වන, (5) වන, (6) වන, (7) වන සහ (8) වන උපවගන්තිවල දක්වා ඇති සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලවල සාමාජිකයන්, අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස, අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු ය.

(ආ) අමාත්‍යවරයා විසින්, සභාපති ලෙස පත් කරනු ලැබූ සාමාජිකයා ද ඇතුළුව එවැනි යම් සාමාජිකයකු තවත් අවුරුදු තුනක ධුර කාලයක් සඳහා නැවත පත් කරනු ලැබිය හැකි ය.

(ඇ) (4) වන, (5) වන, (6) වන (7) වන සහ (8) වන උපවගන්තිවල දක්වා ඇති සමාගම්වල සහ I වන උපලේඛනයේ (එ)(i) සහ (එ)(ii) අයිතමවල දක්වා ඇති සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල විසින් ඔවුන් එම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ලෙස ධුරය භාර ගැනීමට පෙරාතුව ඔවුන්ගේ පත්වීමේ දිනය වන විට පවතින ස්වකීය බැඳියාවන් පිළිබඳ පොදු අනාවරණය කිරීමක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඉදිරියේ දී සළකා බැලිය යුතු යම් කාරණයක් සම්බන්ධයෙන්, සෘජුව හෝ වක්‍රව යම් බැඳියාවක් ඇති (4) වන, (5) වන, (6) වන, (7) වන සහ (8) වන උපවගන්තිවල දක්වා ඇති සමාගම්වල සහ I වන උපලේඛනයේ (එ)(i) සහ (එ)(ii) අයිතමවල දක්වා ඇති සමාගම්වල යම් අධ්‍යක්ෂවරයකු විසින් එකී බැඳියාවේ ස්වභාවය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනාවරණය කරනු ලැබිය යුතු අතර එම කාරණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගි නොවිය යුතු ය.

(9) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ හෝ නියෝජිතයකු නොවන යම් තැනැත්තකු විසින් I වන උපලේඛනයේ (අ), (ඉ), (ඊ), (උ), (ඌ)(i), (එ)(i) සහ (එ)(ii) අයිතමවල දක්වා ඇති සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල දෙකක හෝ ඊට වැඩි ගණනක සමාජිකයකු ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(10) (4) වන, (5) වන, (6) වන, (7) වන සහ (8) වන උපවගන්තිවල දක්වා ඇති සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල විසින් -

(අ) කලින් කලට, පහත දැක්වෙන ප්‍රතිපත්ති පිළිබඳ කෙටුම්පත් සකස් කළ යුතු ය:-

(i) ව්‍යවසාය කළමනාකරණ ප්‍රතිපත්තිය;

(ii) ආයෝජන සහ ප්‍රසම්පාදන ප්‍රතිපත්තිය;

(iii) ව්‍යවසාය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය;

(iv) මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්තිය;

(v) හෙළිදරව් කිරීමේ ප්‍රතිපත්තිය;

(vi) දූෂණ විරෝධී ප්‍රතිපත්තිය;

(vii) මානව සම්පත් ප්‍රතිපත්තිය; සහ

(viii) උපාය මාර්ගික සන්නිවේදන ප්‍රතිපත්තිය;

(ආ) අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රතිපත්ති කෙටුම්පත් අමාත්‍යවරයා වෙත භාර දිය යුතු ය; සහ

(ඇ) අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති කෙටුම්පත්වලට අනුමැතිය ලබා දීමෙන් පසුව, සමාගමේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය පිළිබඳ සියලු කාරණා සම්බන්ධයෙන් එම ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු ය.”.

**14**. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ -

(අ) (ආ) ඡේදයේ “අවුරුදු දෙකකට පසු නොවන දිනයක ” යන වචන වෙනුවට “අවුරුදු එකකට පසු නොවන දිනයක ” යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (ඇ) ඡේදයේ -

(i) “I වන උපලේඛනයේ (අ), (ඊ), සහ (ඌ)(ii) අයිතමවල” යන වචන සහ ඉලක්කම් වෙනුවට “I වන උපලේඛනයේ (අ), (ඉ), (ඊ), (උ) සහ (ඌ)(ii) අයිතමවල” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) “බැහැර කරනු ලැබිය හැකිය:” යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට, “බැහැර කරනු ලැබිය හැකි ය.” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ -

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) සැපයුම් වගකීම් ඇතුළුව ලංකා විදුලිබල මණ්ඩලයේ පවත්නා මූල්‍ය වගකීම් අනුප්‍රාප්තික සමාගම් අතර බෙදා හරිනු ලබන්නේ කවර අනුපාතවලින් ද යන්න නිශ්චිතව දැක්විය යුතු ය;";

(ආ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ (ii) වන අනුඡේදයේ "සේවකයන්ගේ අර්ථසාධක අරමුදලේ වගකීම්" යන වචන වෙනුවට, "සේවකයන්ගේ අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් අරමුදලේ වගකීම්" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "මේ වගන්තිය ක්‍රියාත්මක වීමෙන් මාස හතරක් ඇතුළත" යන වචන ඒ ඡේදයේ යෙදෙන කවර හෝ අවස්ථාවක දී ඒ වෙනුවට, "මේ වගන්තිය ක්‍රියාත්මක වීමෙන් මාස දහහතරක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) ඒ උපවගන්තියේ (උ) ඡේදයේ "අරමුදල් මූලාශ්‍රය හඳුනා ගනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට, "අරමුදල් මූලාශ්‍රය හඳුනා ගනු ලැබිය යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) ඒ උපවගන්තියේ (උ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :-

"(ඌ) අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට අවුරුද්දකට පෙරාතුවම වූ දිනයේ දී (මේ ඡේදයේ "උත්පාදන සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) I වන උපලේඛනයේ (අ) අයිතමයේ දක්වා ඇති උත්පාදන සමාගමේ ධුර දරන සියලුම නිලධරයන් සහ සේවකයන් -

(i) උත්පාදන සමාගම විසින් නිසි පරිදි හඳුනා ගනු ලබන බවට;

(ii) අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දිනයේ සිට මාස හතරක් ඇතුළත, I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති අදාළ අනුප්‍රාප්තික සමාගම් වෙත, ඔවුන්ගේ යෝජිත අනියුක්ත කිරීම සම්බන්ධයෙන් උත්පාදන සමාගම විසින්, දැනුම් දෙනු ලබන බවට; සහ

(iii) (ii) වන අනුඡේදයේ දක්වා ඇති දැන්වීම ලැබීමෙන් පසු මාස දෙකක් ඇතුළත 1 වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති එකී අදාළ අනුප්‍රාප්තික සමාගම්වලට අනියුක්ත වීමට ඔවුන් තෝරා ගන්නේ ද නැති ද යන්න උත්පාදන සමාගම වෙත දැනුම් දිය යුතු බවට,

සහතික විය යුතු අතර, අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට අවුරුද්දකට පසුව වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ලංකා විදුලිබල මණ්ඩලයේ සේවානියුක්ත ගිවිසුම යටතේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඔවුන් විසින් භුක්ති විඳිනු ලැබූ නියම සහ කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවන නියම සහ කොන්දේසි මත අවසාන පැවරීමේ සැලැස්ම යටතේ I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති එකී අනුප්‍රාප්තික සමාගම් වෙත අනියුක්ත කරනු ලැබිය යුතු ය. යම් සේවා නියුක්තයකු අවසාන පැවරීමේ සැලැස්ම යටතේ I වන උපලේඛනයේ (එ)(i) අයිතමයේ දක්වා ඇති යම් අනුප්‍රාප්තික සමාගමකට අනියුක්ත වීමට තෝරා නොගන්නා අවස්ථාවක දී, එකී සේවානියුක්තයා ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයකට හිමිකම් ලැබිය යුතු

අතර, එකී යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසි අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට මාස හතරක් ඇතුළත නියම කරනු ලැබිය යුතු ය; සහ

(එ) අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට අවුරුද්දකට පෙරාතුවම වූ දිනයේ දී (මේ ඡේදයේ "බෙදාහැරීමේ සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) I වන උපලේඛනයේ (උ) අයිතමයේ සඳහන් බෙදා හැරීමේ සමාගමේ ධුර දරන සියලුම නිලධරයන් සහ සේවකයන් -

(i) බෙදා හැරීමේ සමාගම විසින් නිසි පරිදි හඳුනා ගනු ලබන බවට;

(ii) අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දිනයේ සිට මාස හතරක් ඇතුළත, I වන උපලේඛනයේ (එ )(ii) අයිතමයේ දක්වා ඇති අදාළ අනුප්‍රාප්තික සමාගම් වෙත, ඔවුන්ගේ යෝජිත අනියුක්ත කිරීම සම්බන්ධයෙන් බෙදා හැරීමේ සමාගම විසින් දැනුම් දෙනු ලබන බවට; සහ

(iii) (ii) වන අනුඡේදයේ දක්වා ඇති දැන්වීම ලැබීමෙන් පසු මාස දෙකක් ඇතුළත, I වන උපලේඛනයේ (එ)(ii) අයිතමයේ දක්වා ඇති එකී අදාළ අනුප්‍රාප්තික සමාගම්වලට අනියුක්ත වීමට ඔවුන් තෝරා ගන්නේ ද නැතිද යන්න බෙදා හැරීමේ සමාගම වෙත දැනුම් දිය යුතු බවට,

සහතික විය යුතු අතර, අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට අවුරුද්දකට පසුව වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ලංකා විදුලිබල මණ්ඩලයේ සේවානියුක්ත ගිවිසුම යටතේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඔවුන් විසින් භුක්ති විඳිනු ලැබූ නියම සහ කොන්දේසිවලට වඩා අඩුවෙන් වාසිදායක නොවන නියම සහ කොන්දේසි මත අවසාන පැවරීමේ සැලැස්ම යටතේ I වන උපලේඛනයේ (එ)(ii) අයිතමයේ දක්වා ඇති එකී අනුප්‍රාප්තික සමාගම් වෙත අනියුක්ත කරනු ලැබිය යුතු ය. යම් සේවානියුක්තයකු අවසාන පැවරීමේ සැලැස්ම යටතේ I වන උපලේඛනයේ (එ)(ii) අයිතමයේ දක්වා ඇති යම් අනුප්‍රාප්තික සමාගමකට අනියුක්ත වීමට තෝරා නොගන්නා අවස්ථාවක දී, එකී සේවානියුක්තයා ස්වේච්ඡා විශ්‍රාම යාමේ යෝජනා ක්‍රමයකට හිමිකම් ලැබිය යුතු අතර, එකී යෝජනා ක්‍රමයේ නියම සහ කොන්දේසි අවසාන පැවරීමේ සැලැස්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට මාස හතරක් ඇතුළත නියම කරනු ලැබිය යුතු ය.”.

**15**. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

“(3) (අ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත, ශ්‍රී ලංකා රජය විසින් -

(i) සියයට සියයක ප්‍රතිශතයකින් එහි කොටස් දරන සීමාසහිත සමාගමක්

පමණක් ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය;

(ii) සියයට සියයක ප්‍රතිශතයකින් එහි කොටස් දරන සීමාසහිත සමාගමක් පමණක් ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රය නිකුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට යෝග්‍ය විය යුතු ය.

(ආ) සැක දුරු කිරීම සඳහා, -

(i) එක් ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රයක් පමණක්; සහ

(ii) එක් ජාතික සම්ප්‍රේෂණ ජාල සේවා සැපයුම්කරු බලපත්‍රයක් පමණක්,

මේ පනත යටතේ ප්‍රදානය කරනු ලබන බවට මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.'';

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ, ''යම් තැනැත්තකුට'' යන වචන වෙනුවට, ''2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද යම් සමාගමකට'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

''(6) (අ) ශ්‍රී ලංකා ආණ්ඩුව හැර තනි සමාගමක සියයට පහකට වඩා වැඩි කොටස් ප්‍රමාණයක් සෘජුව හෝ වක්‍රව දරන්නා වූ උත්පාදන බලපත්‍රයක් දරනු ලබන යම් තැනැත්තකුට බෙදා හැරීමේ බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුව හැර තනි සමාගමක සියයට පහකට වඩා වැඩි කොටස් ප්‍රමාණයක් සෘජුව

හෝ වක්‍රව දරන්නා වූ බෙදා හැරීමේ බලපත්‍රයක් දරනු ලබන යම් තැනැත්තකුට උත්පාදන බලපත්‍රයක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(ඇ) ශ්‍රී ලංකා ආණ්ඩුව හැර තනි සමාගමක සියයට පහකට වඩා වැඩි කොටස් ප්‍රමාණයක් ඍජුව හෝ වක්‍රව දරන්නා වූ යම් තැනැත්තකුට එක් බෙදා හැරීමේ බලපත්‍රයකට වඩා වැඩි බෙදා හැරීමේ බලපත්‍ර සංඛ්‍යාවක් නිකුත් නොකළ යුතු ය.

(ඈ) ශ්‍රී ලංකා ආණ්ඩුව හැර, යම් තැනැත්තකු හෝ සමාගමක් විසින් -

(i) උත්පාදන බලපත්‍රයක් සහ බෙදා හැරීමේ බලපත්‍රයක්; හෝ

(ii) එකකට වඩා වැඩි බෙදාහැරීමේ බලපත්‍ර සංඛ්‍යාවක්,

නිකුත් කරනු ලැබ ඇති සමාගම් දෙකක ඍජුව හෝ වක්‍රව එකවර සියයට පහකට වඩා වැඩි කොටස් ප්‍රමාණයක් දරනු නොලැබිය යුතු ය.''.

**16**. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ''උත්පාදන බලපත්‍රලාභියකුට-'' සහ ''හිමිකම් ලැබිය යුතු ය.'' යන වචන වෙනුවට, පිළිවෙලින් ''උත්පාදන බලපත්‍රලාභියකු විසින් -'' සහ ''ක්‍රියා කරනු ලැබිය යුතු ය.'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (උ) ඡේදයේ ''ජාතික පද්ධති ක්‍රියාකරු බලපත්‍රලාභියා'' යන වචන වෙනුවට, ''ජාතික පද්ධති ක්‍රියාකරු'' යන වචන ආදේශ කිරීමෙන්.

**17**. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ''උත්පාදනයේ සහ බෙදා හැරීමේ නිරත වන අවස්ථාවක දී සහ එසේ උත්පාදනය කළ විදුලි ධාරිතාවය හෝ ප්‍රමාණය'' යන වචන වෙනුවට, ''උත්පාදනයේ, බෙදා හැරීමේ හෝ

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම

සැපයීමේ නිරත වන අවස්ථාවක දී සහ එසේ උත්පාදනය කළ, බෙදා හරින ලද හෝ සපයන ලද විදුලි ධාරිතාවය හෝ ප්‍රමාණය'' යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ -

(අ) ''ජාතික අයක්‍රම ප්‍රතිපත්තියට අනුව'' යන වචන වෙනුවට, ''ජාතික අයක්‍රම ප්‍රතිපත්තියට අනුව, මුදල් අමාත්‍යාංශය විමසා,'' යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (අ) ඡේදයේ ''ජාතික පද්ධති ක්‍රියාකරු'' යන වචන වෙනුවට, ''ජාතික පද්ධති ක්‍රියාකරු සහ බෙදා හැරීමේ බලපත්‍රලාභීන්'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ අතුරු විධානයේ ''IX වන කොටස ප්‍රකාර'' සහ ''''තොග විදුලිබල වෙළෙඳපොළ'''' යන වචන සහ ඉලක්කම් වෙනුවට, පිළිවෙළින් ''30 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (ii) වන අනුඡේදය ප්‍රකාර'' සහ ''''තරඟකාරී තොග විදුලිබල වෙළඳපොළ'''' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ ''තොග විදුලිබල වෙළෙඳපොළ ක්‍රියාත්මක වීම ආරම්භ කරනු ලැබිය යුතු දිනය නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.'' යන වචන වෙනුවට ''(2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති එක් එක් විදුලිබල වෙළෙඳපොළ ක්‍රියාත්මක වීම ආරම්භ කරනු ලැබිය යුතු දින නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) (අ) ජාතික විදුලිබල වෙළෙඳපොළ තරඟකාරී වෙළෙඳපොළක් විය යුතු අතර, එය ක්‍රියාත්මක කිරීමේ දී අනුගමනය කරනු ලැබිය යුතු කාර්යපටිපාටි නියම කරනු ලබන ආකාරයට විය යුතු ය.

(ආ) ජාතික විදුලිබල වෙළෙඳපොළ පහත දැක්වෙන එකකින් හෝ දෙකක් හෝ ඊට වැඩි ගණනක එකතුවකින් හෝ එනම්:-

(i) ජාතික පද්ධති ක්‍රියාකරුගේ ඉදිරි දිනයේ සහ දිනය ඇතුළත අවශ්‍යතාවන්ට කෙටි කාලීන විදුලි ප්‍රසම්පාදනය සඳහා පහසුකම් සපයනු ලබන තරඟකාරී තොග විදුලිබල ස්ථානීය වෙළෙඳපොළකින්;

(ii) උත්පාදන බලපත්‍රලාභීන් සහ බෙදාහැරීමේ බලපත්‍රලාභීන් අතර දිගුකාලීන විදුලි සැපයීමේ වෙළෙඳ ගිවිසුම් සඳහා පහසුකම් සපයනු ලබන තරඟකාරී තොග විදුලිබල වෙළෙඳපොළකින්;

(iii) ජාතික පද්ධති ක්‍රියාකරු සඳහා සංඛ්‍යාත පාලන ආනුෂංගික සේවා, ප්‍රතික්‍රියක බල ආනුෂංගික සේවා සහ පූර්ණ විදුලිබල පද්ධති බිඳවැටීමක දී විදුලිබල පද්ධතිය නැවත පණගැන්වීමේ ආනුෂංගික සේවා ඇතුළත් තරඟකාරී ආනුෂංගික සේවා වෙළෙඳපොළකින්; සහ

(iv) සිල්ලර විදුලිබල වෙළෙඳපොළකින්,

සමන්විත විය යුතු ය.";

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(3අ) මේ උපවගන්තිය ක්‍රියාත්මක වීමෙන් පසුව, අමාත්‍යවරයා විසින්, ජාතික විදුලිබල වෙළෙඳපොළ ක්‍රියාත්මක කිරීමට ජාතික පද්ධති ක්‍රියාකරුට හැකියාව ලබා දීමේ අදහසින් නියමිත දින සිට වසර තුනකට නොඅඩු කාලයක දී, ජාතික විදුලිබල වෙළෙඳපොළ කාර්යක්ෂමව ක්‍රියාත්මක වීමට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය නියම හා කොන්දේසි ඇතුළත් ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව සමඟ වෙළෙඳපොළ ආකෘති සකස් කිරීම සඳහා ජාතික පද්ධති ක්‍රියාකරුට නියම කළ යුතු ය."; සහ

(4) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ "තොග විදුලිබල වෙළෙඳපොළ" යන වචන වෙනුවට "29 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව නියම කර ඇති අයක්‍රමය සමඟ අන්තර් සම්බන්ධතා ධාරිතාව මෙගාවොට් 10 ක් නොඉක්මවිය යුතු, ජාතික විදුලිබල වෙළෙඳපොළ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම

**20**. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය, එහි "මේ පනතේ විධිවිධාන සඳහා හෝ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය." යන වචන වෙනුවට, "මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු යම් තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට හෝ යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම

**21**. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ "අමාත්‍යවරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"""ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග" යන්නෙන්, 2019 අගෝස්තු මස 9 වන දින අංක 2135/61 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපාය මාර්ග සහ ගැසට් පත්‍රයේ පළ කරන ලද ඊට පසුව සිදු කරන ලද ප්‍රතිශෝධන සහ යාවත්කාලීන කිරීම් අදහස් වේ;"; සහ

(2) ඒ වගන්තියේ "කලාපීය සම්ප්‍රේෂණ ජාලය" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"""ආර්ථිකමය වශයෙන් ආරක්ෂාකාරීව මෙහෙයවීමේ සීමාවන්ට යටත්ව ප්‍රේෂණය කිරීම" යන්නෙන්, උත්පාදක හැකියාවන්, අවම සහ උපරිම ප්‍රතිදාන මට්ටම්, ප්‍රතිදානයන් වෙනස් කිරීමේ ශීඝ්‍රතාවයන්, සංචිත අවශ්‍යතා, සම්ප්‍රේෂණ මාර්ග සීමාවන්, වෝල්ටීයතා සීමාවන් සහ ස්ථායිතා සීමාවන් ආදී විදුලිබල පද්ධති ජාලයේ ස්ථායීතාවය, විශ්වසනීයත්වය සහ ආරක්ෂාව ප්‍රකාරව සියලු පද්ධති මෙහෙයුම් සීමාවන් නිසි ලෙස සැලකිල්ලට භාජනය කිරීම සහතික කරමින් විදුලි ඉල්ලුම සපුරාලීමට පවතින විදුලි උත්පාදන ඒකක අතරින් වඩාත්ම පිරිවැයට අනුව ඵලදායී ප්‍රශස්ත තෝරා වෙන්කර ගැනීම තීරණය කරන ක්‍රියාවලිය වේ;".

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනය සංශෝධනය කිරීම

(1) ඒ උපලේඛනයේ (අ) අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(අ) (i) ජල විදුලි බලය උත්පාදනය;

(ii) නොරොච්චෝලේ ලක් විජය ගල් අඟුරු විදුලි පිරියතය සහ ලංකා කෝල් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්;

(iii) ගල් අඟුරු විදුලි උත්පාදන නොවන තාප විදුලි උත්පාදන;

(iv) මන්නාරම තම්බපවනි සුළං විදුලි පිරියතය; සහ

(v) සීමාසහිත ත්‍රිකුණාමල විදුලිබල සමාගම,

සම්බන්ධයෙන් මූලික පැවරීමේ සැලැස්මේ දක්වා ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම්, බැරකම් සහ කර්තව්‍ය පවරා ගැනීම සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සියයට සියයක කොටස් දරනු ලබන (මෙහි මින්මතු “උත්පාදන සමාගම” යනුවෙන් සඳහන් කරනු ලබන) එක් සමාගමක්;”;

(2) ඒ උපලේඛනයේ (ආ), (ඇ) සහ (ඈ) අයිතම ඉවත් කිරීමෙන්;

(3) ඒ උපලේඛනයේ (ඉ) අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

“(ඉ) (i) ශ්‍රී ලංකාවේ ජාතික ජාලකය සැකසෙන්නා වූ භෞතික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම;

(ii) වෙනත් තෝරාගත් වත්කම්, කර්තව්‍ය හා කටයුතු; සහ

(iii) එල්ටීඑල් හෝල්ඩින්ස් ලිමිටඩ් සහ ශ්‍රී ලංකා එනජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,

සම්බන්ධයෙන් මූලික පැවරීමේ සැලැස්මේ දක්වා ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම්, බැරකම් සහ කර්තව්‍ය පවරා ගැනීම සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සියයට සියයක කොටස් දරනු ලබන එක් සමාගමක්;";

(4) ඒ උපලේඛනයේ (උ) අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(උ) (i) 1 වන අංශය, 2 වන අංශය, 3 වන අංශය සහ 4 වන අංශය යන බෙදා හැරීම් අංශ;

(ii) වෙනත් තෝරාගත් වත්කම්, කර්තව්‍ය සහ කටයුතු; සහ

(iii) සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම,

සම්බන්ධයෙන් මූලික පැවරීමේ සැලැස්මේ දක්වා ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ වත්කම්, බැරකම් සහ කර්තව්‍ය පවරා ගැනීම සඳහා භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් සියයට සියයක කොටස් දරනු ලබන (මෙහි මින්මතු "බෙදා හැරීමේ සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) එක් සමාගමක්;";

(5) ඒ උපලේඛනයේ (ඌ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"(එ) (i) අවසාන පැවරීමේ සැලැස්මේ දක්වා ඇති පරිදි උත්පාදන සමාගමේ උත්පාදන කර්තව්‍ය පවරා ගැනීම සඳහා සමාගම් යම් සංඛ්‍යාවක්;

(ii) අවසාන පැවරීමේ සැලැස්මේ දක්වා ඇති පරිදි බෙදා හැරීමේ සමාගමේ බෙදා හැරීම් අංශවල බෙදා හැරීම් කර්තව්‍ය පවරා ගැනීම සඳහා සමාගම් යම් සංඛ්‍යාවක්.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**23**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.